# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2115/51 - 2019 මාර්තු මස 23 වැනි සෙනසුරාදා - 2019.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: එම්එල්බී/එල්එන්ඩී/එල්එන්ඩීඒකිව්/එල්1/44-2.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*:
4-3/9/2016/ඩබ්ලිව්එස්/518.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යයතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාලිම්බඩ ගමේ මු.පි. මාර/2761 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර iv වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ තුළුමං ළිඳ හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගෙන තිබේ.

**උපලේඛනය**

1. කැබලි අංකය 01

ඉඩමේ නම: හෙට්ටිගේවත්ත; ඉඩමේ විස්තරය: ලඳු කැළය; ඉඩමේ මුල් හිමිකම කියන්නා: කේ. කේ. නිලන්ත ලක්මාල් කිතලගම නැගෙනහිර iii, තිහගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0846.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 අප්‍රේල් මස 05 වැනි දින පෙ.ව. 10.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2019 මාර්තු මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2019 මාර්තු මස 21 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-199